**රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 03/2016**

මගේ අංකය :PSC/APP/03/62/2012

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය

අංක 177, නාවල පාර,

නාරාහේන්පිට,කොළඹ 05.

2016 මැයි මස 24 දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

**<u>කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබා දීම</u>**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 ට අනුකූලව සංශෝධිත සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටිවලට අනුව වසරකට දෙවරක් කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්විය යුතු අතර එසේ සංශෝධිත සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටිවලට අනුකූලව, බඳවා ගනු ලබන නිලධාරීන් වසර 03 ක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම ද, II වන ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධාරීන් උසස් වීම් දින සිට වසර 03 ක් ඇතුළත II වන කාර්යක්ෂමතා කඩඉමද, I වන ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධාරීන් උසස් වීම් දින සිට වසර 05 ක් ඇතුළත III වන කාර්යක්ෂමතා කඩඉමද සම්පූර්ණ කළ යුතුය.

02. එසේ වුවද,රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 ට අනුකූලව සංශෝධිත සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටිවලට අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත පරිදි නොපැවැත්වීම නිසා ඇති වන ගැටලු සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි ක්‍රියා කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

03. ඒ අනුව නියමිත සේවා ව්‍යවස්ථාවේ හෝ බඳවා ගැනීමේ පටිපාටියෙහි වසරකට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්විය යුතු වාර ගණන නිශ්චිත වශයෙන් සඳහන් කර ඇති නමුත්, නියමිත පරිදි විභාගය නොපැවැත්වීම මත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත කාලය තුළ සම්පූර්ණ කිරීමට නොහැකි වූ නිළධාරීන්ට ජ්‍යෙෂ්ඨත්වයට හානි නොවන පරිදි, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කළ යුතු කාල සීමාව තුළ සේවා ව්‍යවස්ථාවෙහි හෝ බඳවා ගැනීමේ පටිපාටියෙහි විධිවිධානවලට අනුකූලව පැවැත්වීමට නියමිතව තිබූ විභාග අවස්ථා සංඛ්‍යාවට සමාන අනුගාමී විභාග අවස්ථා සංඛ්‍යාවක් මගින් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කළ හැකිය.